වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபாரமற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය,කොළඹ - 01
செயலகம்,கொழும்பு - 01
The Secretariat, Colombo -01

මුදල් අමාත්‍යාංශය
நிதிஅமைச்சு
Ministry of Finance

මගේ අංකය / எனது இல. / My No. TIP/TP/01/10 (146)
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2020.12.14

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේමුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල් අමාත්‍යතුමා විසින් පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය 2020.12.14 දිනැති අංක 2206/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්-**

- රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා

දුරකථන අංකය / தொலைபேசி / Telephone 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax 0112484 962 / 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.treasury.gov.lk

**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**2 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 දෙසැම්බර් මස 15 දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.06.16 දිනැති අංක 2180/10 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය, 2020.06.16 දිනැති අංක 2180/11 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය, 2020.06.26 දිනැති අංක 2181/23 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය, 2020.06.26 දිනැති අංක 2181/24 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය සහ 2020.07.10 දිනැති අංක 2183/44 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත අදාල නියමයන් 2020 දෙසැම්බර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් අමාත්‍ය**

2020 දෙසැම්බර් මස 14 වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු55.00 |
| 2 | | 0805.22.10 | ක්ලෙමන්ටයින් - අළුත් | කි. ග්‍රෑමයට රු. 120.00 |
| 3 | | 0805.22.20 | ක්ලෙමන්ටයින් - වියළි | කි. ග්‍රෑමයට රු. 250.00 |
| 4 | | 0805.29.10 | අනෙකුත් - අළුත් | කි. ග්‍රෑමයට රු. 120.00 |
| 5 | | 0805.29.20 | අනෙකුත් - වියළි | කි. ග්‍රෑමයට රු. 250.00 |
| 6 | | 0805.40.10 | මහසිදරන්,පොමෙලෝස් ඇතුළුව - අළුත් | කි. ග්‍රෑමයට රු. 285.00 |
| 7 | | 0805.40.20 | මහසිදරන්,පොමෙලෝස් ඇතුළුව - වියළි | කි. ග්‍රෑමයට රු. 300.00 |
| 8 | | 0805.90.10 | අනෙකුත් - අළුත් | කි. ග්‍රෑමයට රු. 300.00 |
| 9 | | 0805.90.20 | අනෙකුත් - වියළි | කි. ග්‍රෑමයට රු. 375.00 |
| 10 | | 0808.30 | පෙයාර්ස් | කි. ග්‍රෑමයට රු. 220.00 |
| 11 | 08.09 | 0809.10 | ඇප්‍රිකොට් | කි. ග්‍රෑමයට රු. 350.00 |
| 12 | | 0809.21 | ඇඹුල් චෙරිස් (ප්‍රූනුස් සෙරාසස්) | කි. ග්‍රෑමයට රු. 330.00 |
| 13 | | 0809.29 | අනෙකුත් - චෙරිස් | කි. ග්‍රෑමයට රු. 315.00 |
| 14 | | 0809.30 | නෙක්ටාරින්ස් ඇතුළු පීචස් | කි. ග්‍රෑමයට රු. 310.00 |
| 15 | | 0809.40 | ප්ලම්ස් සහ ස්ලෝස් | කි. ග්‍රෑමයට රු. 250.00 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | 15.07 | | **ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සෝයා බෝංචි තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | 1507.10 | මැලියම් ඉවත් කළ හෝ නොකළ අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 250 |
| | | 1507.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 275 |
| | 15.11 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | 1511.10 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 250 |
| | | 1511.90 | අනෙකුත් : | |
| | | 1511.90.10 | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | කි. ග්‍රෑමයට රු. 250 |
| | | 1511.90.20 | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | කි. ග්‍රෑමයට රු. 275 |
| | | 1511.90.30 | ශුද්ධ නොකළ පාම් ඔලේන් | කි. ග්‍රෑමයට රු. 255 |
| | | 1511.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 275 |
| | 15.12 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ සූර්යකාන්ත ඇටවල තෙල්, සෆ්ෆ්ලවර් හෝ කපු ඇට තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | | **සූර්යකාන්ත ඇටවල තෙල් හෝ සෆ්ෆ්ලවර් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස්.** | |
| | | 1512.11 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 250 |
| | | 1512.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 275 |
| | 15.13 | | **ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකල, පොල් (කොප්පරා) පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස්.** | |
| | | | | |
| | | | පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස් : | |
| | | 1513.11 | අශුද්ධ තෙල් : | |
| | | | තොග වශයෙන් : | |

| | | | | |
|---|---|---|---|---|
| | | 1513.11.11 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 125 |
| | | 1513.11.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 125 |
| | | | අනෙකුත් : | |
| | | 1513.11.21 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 125 |
| | | 1513.11.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 125 |
| | | 1513.19 | අනෙකුත් : | |
| | | 1513.19.10 | තොග වශයෙන් | කි. ග්‍රෑමයට රු. 150 |
| | | 1513.19.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 150 |
| | | | පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් : | |
| | | 1513.21 | අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 250 |
| | | 1513.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 275 |
| 17 | 15.16 | 1516.20 | ශාඛමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් | කි.ග්‍රෑමයට රු. 160 |
| 18 | 15.17 | 1517.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 200 |